ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ලංසු සඳහා ආරාධනය (IFB)

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කාර්යයන් සඳහා **2026.11.18 දින ප.ව 2.30** දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

යොමු අංකය	කාර්යය පිළිබඳ විස්තරය	ලංසු ලේඛන සඳහා ආපසු නොගෙවන ගාස්තුව (රු.)	ඇස්තමේන්තුගත පිරිවැය (රු.)	අවශ්‍ය CIDA ශ්‍රේණිය	ලංසු ඇපකරය (රු.)	කාර්යය නිම කිරීමේ කාලය
SU/CWP/03/325	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය කිරීම	10,000.00	49,800,000.00	C6 / C5 / C4	747,000.00	280 days
SU/CWP/01/326	ආර්ථික විද්‍යා හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ සමාජ විද්‍යා හා භාෂා පීඨයේ පීඨාධිපති කාර්යාලය සඳහා කාපට් ඇතිරීමේ යෝජිත කාර්යය	1000.00	958,000.00	C9 / C8 / C7	14,370.00	දින 30

ලංසු කැඳවීමේ ක්‍රමය: ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය (NCB) යටතේ සිදු කෙරේ.

ලංසු ලේඛන පරීක්ෂා කිරීම හා ලබා ගැනීම: ලංසු ලේඛන **2026.10.29 සිට 2026.11.17** දක්වා සාමාන්‍ය වැඩ කරන දිනවලදී පෙ.ව **9.00 සිට ප.ව 2.30** දක්වා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මූලධන හා සැලසුම් අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයෙන් පරීක්ෂා කර ලබා ගත හැක.

ලංසු ලේඛන ලබා ගැනීම හා ගාස්තු: ලංසු ලේඛන නිකුත් කරනු ලබන්නේ ලංසුකරුගේ නිල ව්‍යාපාරික ලිපි ශීර්ෂය සහිත ලිපියක් මගින් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ නිසි බලයලත් නියෝජිතයන්ට පමණි. ඉහත සඳහන් ආපසු නොගෙවන ගාස්තුව විශ්වවිද්‍යාලයේ සරප් වෙත මුදලින් ගෙවා **2026.11.17 දින ප.ව 2.30** දක්වා ලංසු ලේඛන මිලදී ගත හැක.

CIDA ලියාපදිංචිය: ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී අදාළ ශ්‍රේණිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) වලංගු ලියාපදිංචියක් තිබිය යුතු අතර, එයට අදාළ ලේඛනමය සාක්ෂි ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

මූල්‍ය හා තාක්ෂණික හැකියාව: අදාළ ලංසු ලේඛනවල ලංසුකරුවන්ට දී ඇති උපදෙස් සහ කොන්දේසිවල සඳහන් මූල්‍ය හා තාක්ෂණික අවශ්‍යතා සපුරාලන බව ලංසුකරුවන් විසින් තහවුරු කර ගත යුතුය.

ලංසු භාරදීම: ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ අතින් ගෙනවිත් භාරදීමෙන්, **2026.11.18 දින ප.ව 2.30** ට පෙර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, තැ.පෙ. 02, බෙලිහුල්ඔය යන ලිපිනයට ලංසු භාරදිය යුතුය. අදාළ ලංසුවේ යොමු අංකය **(SU/CWP/03/325 හෝ SU/CWP/01/326) සහ "මූලධන හා සැලසුම් අංශය"** යනුවෙන් මුද්‍රා තැබූ ලංසු කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන හෝ අසම්පූර්ණ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු විවෘත කිරීම: ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක. ලංසු **2026.11.18 දින ප.ව 2.30** ට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ, ලේඛකාධිකාරී කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

වැඩිදුර තොරතුරු: වැඩිදුර තොරතුරු සාමාන්‍ය රාජකාරි වේලාවන් තුළ මූලධන හා සැලසුම් අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී **කාර්යාලයෙන් 045-2280031** දුරකථන අංකය ඔස්සේ ලබා ගත හැක.

අදාළ ප්‍රසම්දන නීති හා මාර්ගෝපදේශවලට යටත්ව, පූර්ව දැනුම්දීමකින් තොරව ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ ලංසු ක්‍රියාවලිය අවලංගු කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

සැලකිය යුතුයි – පරිගණක විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය කිරීම

- ❖ පරිගණක විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යය සඳහා ලංසු ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ලංසුකරුවන් වෙනුවෙන් පූර්ව ලංසු රැස්වීමක් **2026.11.04 දින පෙ.ව.10.30** ට පරිගනක පීඨයේ, පීඨාධිපති කාර්යාලයේදී පැවැත්වේ. ලංසු ඉදිරිපත් කිරීමට පෙර අදාළ ස්ථානය පරීක්ෂා කර එහි තත්ත්වයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගන්නා ලෙස ලංසුකරුවන්ට උපදෙස් දෙනු ලැබේ. ස්ථානීය පරීක්ෂාව පූර්ව ලංසු රැස්වීමෙන් පසුව සිදු කළ හැකි අතර, ඒ සඳහා වැය වන සියලු වියදම් ලංසුකරුවන් විසින් දැරිය යුතුය.
- ❖ **1987 අංක 3 දරන රාජ්‍ය කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි වීම**
  කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම රුපියල් 5,000,000.00 ඉක්මවන අවස්ථාවලදී, 1987 අංක 3 දරන රාජ්‍ය කොන්ත්‍රාත් පනතේ විධිවිධාන අදාළ වේ. ඒ අනුව, අදාළ පනතේ සහ බලපැවැත්වෙන රෙගුලාසිවල අවශ්‍යතා අනුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය කොන්ත්‍රාත් ලේඛකාධිකාරීවරයා විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකය (PCA 03 ආකෘති පත්‍රය) ලංසුකරු විසින් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

සභාපති, ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
තැ.පෙ. 02, බෙලිහුල්ඔය

දිනය : 2026.10.29